**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය.
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
**-----------------------**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවට අයත් පුස්තකාල ගොඩනැගිලි 03 ක ඉඩම්වල අයිතිය පවරා ගෙන නොතිබූ අතර, ඒ පිළිබඳ ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) රාජ්‍ය ආයතන කීපයකින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු එහෙත්, සභාවට අයිතිය පවරා ගෙන නොතිබුණු රු.34,819,323 ක් වටිනා වාහන 07 ක් සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 ලැබියයුතු ගිණුම්.
**--------------------**

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 04 ක එකතු වටිනාකම රු.16,530,715 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.8,037,817 ක් වී තිබුණි.

#### 1.3.3 ගෙවියයුතු ගිණුම්.
**--------------------**

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති ගෙවියයුතු ගිණුම් ශේෂ 03 ක එකතු වටිනාකම රු.10,970,700 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.5,738,267 ක් වී තිබුණි. මෙම ශේෂයෙන් 2016 මාර්තු 31 දිනට රු.183,488 ක් තවදුරටත් ගෙවියයුතුව තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

ගිණුම් විෂයයන් 03 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.990,922 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසීවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරික්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත. | |
| | 49 වගන්තිය. | සභා බල ප්‍රදේශයේ ඉදි කරනු ලබන අනවසර ඉදි කිරීම් සම්බන්ධව නීතිමය කටයුතු කිරීම සිදු කළයුතු වුවත්, 2015 වර්ෂයේ සහ ඊට පෙර වර්ෂවල කර තිබුණු අනවසර ඉදි කිරීම් 05 ක් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | 1971 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත. | |
| | 21 වගන්තිය. | 2010 සිට 2014 දක්වා කාලය තුළ අනුමත කළ ගොඩනැගිලි සැළසුම් 1355 කට අදාළව අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ 100 ක් සඳහා පමණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,806,565 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,178,488 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.8,628,077 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

වර්ෂයේ එකතු කරන ආදායමට සාපේක්ෂව වියදම් සැළසුම් කළයුතු වුවත්, වැඩසටහන් අනුව, සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් හා වියදම් සසඳා බැලීමේ දී වැඩසටහන් 05 ක ආදායමට සාපේක්ෂව සියයට 77 සිට සියයට සියය ඉක්ම වූ වියදම් දක්නට ලැබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

-----------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 දිනට හිඟ ශේෂය | 2015 වර්ෂය බිල් කිරීම් | 2015 ලැබීම් දුන් වට්ටම්/ කපා හැරීම් | හිඟයෙන් ලැබීම් | 2015 බිල් කිරීම්වලින් ලැබීම් | 2015.12.31 දිනට හිඟ ශේෂය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,560,316 | 9,659,109 | 230,129 | 3,259,112 | 7,024,187 | 4,705,997 |
| කඩ කාමර/ ගොඩනැගිලි බදු කුළී | -- | 156,850 | -- | -- | 75,550 | 81,300 |
| බලපත්‍ර ගාස්තු | 233,456 | 1,972,135 | -- | 215,566 | 1,688,370 | 301,655 |
| වෙනත් ආදායම් | 29,783,638 | 37,863,076 | -- | 27,292,739 | 1,993,497 | 38,360,478 |
| එකතුව | | | | | | 43,449,430 |

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.43,449,430 ක හිඟ ආදායම් ශේෂයක් නිරීක්ෂණය විය.

### 2.3.2 වරිපනම් බදු.

-------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරුන ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ආදායම රු.5,474,566 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල් කළ ආදායම රු.9,659,109 ක් විය. මින් 2015 දෙසැම්බර් 31 දිනට අය කර තිබුණේ පිළිවෙළින් රු.3,259,112 ක් හා රු.6,905,044 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 59 ක් හා සියයට 72 ක් විය. මේ අනුව, වරිපනම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) රු.1,000 ට වඩා වැඩි වටිනාකමක් ඇති වරිපනම් ගෙවියයුතු බදු කරුවන් 1836 කගෙන් වර්ෂ 01 සිට වර්ෂ 34 දක්වා කාල පරාසයක හිඟ හිටි වරිපනම් බදු රු.4,620,247 ක් විය. මේ සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ රජයට සම්බන්ධ ආයතන සහ ඇතැම් ව්‍යාපාරික ස්ථානවලින් හා දේපළවලින් වරිපනම් බදු අය කිරීම සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය වූ අතර, එවැනි බදු ඒකක 27 කින් රු.142,157 ක හිගයක් 2015 දෙසැම්බර් 31 දිනට පැවතුණි.

**2.3.3 බදු කුළී.**
**----------**

**කඩ කාමර බදු**
**---------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාව සතු මැදවල නව වෙළඳ සංකීර්ණයේ කඩ සාප්පු හා උත්සව ශාලාව මාසික කුළී පදනම මත බදු දීම සඳහා 2010 ඔක්තෝබර් 07 දින හා 2015 ජූලි 13 දිනැති පුවත්පත් දැන්වීම් මගින් ලංසු කැඳවා ඇතත්, 2015 නොවැම්බර් 18 දින වන විටත් අංක 01, 06, 10, 11, 12 දරන කඩ කාමර හා උත්සව ශාලාව බදු දීමට නොහැකි වී තිබුණි.

(ආ) බදුකරු සමග ගිවිසුම්ගතවීමකින් තොරව සභාව සතු සති පොළෙහි කඩ කාමර 09 ක් 2014 අගෝස්තු 25 දින සිට බදු දී තිබුණි.

**2.3.4 බලපත්‍ර ගාස්තු.**
**----------------**

**(අ) වෙළඳ බලපත්‍ර.**
**---------------**

සභා බල ප්‍රදේශයේ වෙළඳ බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර 369 කින් රු.235,500 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) පරිසර බලපත්‍ර.**
**------------------**

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ "ඇ" කොටසේ නිශ්චිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත බල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර ඒකක 65 ක් වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

**2.3.5 ත්‍රී රෝද රථ නැවතුම් ගාස්තු.**
**-----------------------------**

2015 වර්ෂය අවසාන වන විට ත්‍රී රෝද රථ සංගම් 20 ක් ලියාපදිංචි කර තිබූ අතර, එයින් සංගම් 19 කින් රු.237,400 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දින වන විට අය කර ගෙන නොතිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**
**--------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට උසාවි දඩ රු.627,666 ක් හා මුද්දර ගාස්තු රු.36,130,730 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තියේ විධිවිධානවලට අනුව බල ප්‍රදේශයේ විකුණන ඉඩම් කොටස්වලින් සියයට 01 ක බදු මුදල ඉඩම් විකුණන අවස්ථාවේ අය කිරීම වෙනුවට, බ්‍රෝකර්කවරුන්ගෙන් ඉඩම් කට්ටිවල තක්සේරු වටිනාකමක් ලබා ගෙන විකිණීමට පෙර බදු මුදල් අය කර ගෙන තිබූ අතර, ඉඩම් විකිණීම පිළිබදව පසු විපරම් කර, තවදුරටත් සභාවට ලැබියයුතු හිග ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේ උඩුවාවල කහවත්ත නමැති ඉඩම කට්ටි කර විකිණීමේ දී සභාවේ පොදු කටයුතු සදහා වෙන් කර තිබූ ලොට් අංක 07 දරන පර්චස් 8.3 ක බිම් කොටස පොදු කටයුතු සදහා යොදා ගෙන නොතිබුණු අතර, අංක 06 යටතේ ලැබී තිබූ පර්චර්ස් 02 ක පොදු ළිද ද වසා දමා තිබුණි.

(ඇ) රාජකාරී ගමන් සදහා වාහන ධාවනය කිරීමේ දී, දිනය අවසානයේ දී ධාවන සටහන් සම්පූර්ණ කර, අදාළ වාහනය භාවිතා කළ නිලධාරීන්ගෙන් අත්සන් ලබා ගතයුතු වුවත්, සභාවේ වාහන 04 ක කි.මී.662 ක ධාවනය කළ ගමන් සදහා ධාවන සටහන් ලියා නොතිබුණි.

(ඈ) අමාත්‍යාංශ හා ව්‍යාපෘතිවලින් සභාව වෙත ලැබී තිබුණු වාහන 07 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, වාහන අක්‍රීය වීම හා රියැදුරන් නොමැති බව දක්වමින් සභාව සතු වාහන 08 ක් ධාවනයට නොගෙන ඌන උපයෝජිතව තබා තිබුණි.

(ඉ) සභාව සතු RS – 1577 දරන JCB බැකෝ ලෝඩරය සමාලෝචිත වර්ෂයේ පුද්ගලයින් 14 දෙනෙකුට මුදල් අය කිරීමකින් තොරව ලබා දී තිබූ අතර, ඒ වෙනුවෙන් ලැබිය යුතු රු.147,120 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමකින් තොරව මැදවල වෙළද සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමරයක් රු.30,000 ක් හා ඉහළ මාලයේ ඇති උත්සව ශාලාව රු.31,000 ක මුදලකට ඇස්තමේන්තු කර, ටෙන්ඩර් කැදවා ඇතත්, කිසිවෙකු ඒ සදහා ඉදිරිපත් වී නොතිබුණු අතර, 2016 අප්‍රේල් 20 දින වන විටත් වසා දමා තිබුණි. මේ හේතුවෙන්, දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය මුදල් මගින් ඉදි කර තිබූ වෙළද සංකීර්ණයෙන් ලැබෙන ආදායම එම ණය මුදලේ වාරික හා පොළී ගෙවීමට ප්‍රමාණවත් වී නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය.**

**-------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**3.3.1 උඩුවාවල නිකතැන්න පාර සමරසිංහ මහතාගේ නිවස අසළ ඇති බැම්ම ඉදි කිරීම - රු.100,000**

**-----------------------------------------------------------------------------------------------------**

නිකතැන්න පාරට මායිම්ව පදිංචි නිවැසියෙකු තම නිවසට ජලය ගලා ඒම වළකා ගැනීමේ අවශ්‍යතාවය මත රු.250,000 ක පෞද්ගලික ධනය වැය කර ඉදි කර තිබූ කොන්ක්‍රීට් බැම්ම සභාව විසින් කළ ඉදි කිරීමක් බව ව්‍යාජ ලෙස දක්වමින් ඇස්තමේන්තු හා බිල්පත් සකස් කර, රු.100,000 ක මුදලක් කොන්ත්‍රාත්කාර සමිතියක් වෙත ගෙවා මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මෙම ගෙවීම් 2015 ඔක්තෝම්බර් 28 දින සභාව අනුමත කර තිබුණි.

**3.3.2 බෝතොට බෝපිටිය වත්ත පාර සංවර්ධනය කිරීම රු.150,000**

**-----------------------------------------------------------------**

ඉදි කර තිබූ ආරක්ෂිත බැම්මේ ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයේ ගල් යොදා ගෙන තිබූ අතර, බැම්ම බැදීම සඳහා යොදා ගෙන තිබුණු සිමෙන්ති බදාම මිශ්‍රණය ද ඇස්තමේන්තු ප්‍රමිතියට වඩා අඩු මිශ්‍රණයක් යොදා ඉදි කර තිබුණි.

**3.4 අවිධිමත් ගනුදෙනු.**

**---------------------**

පැරණි ප්‍රාදේශීය සභා කාර්යාලයේ තිබුණු භාණ්ඩ රදවා තබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා කාර්යාලයට ආසන්නයෙන් බාහිර පුද්ගලයෙකුට අයත් ගොඩනැගිල්ලක කාමරයක් මසකට රු.8,000 ක් බැගින් සභාව විසින් කුළියට ලබා ගෙන 2014 මාර්තු 03 දින සිට 2015 දෙසැම්බර් 18 දින දක්වා මාස 18 ½ ක් සඳහා රු.148,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. මෙම කාමරය කුළියට ගැනීම සඳහා සභා අනුමැතියක් හා කුළී ගෙවීම සඳහා රජයේ තක්සේරුවක් ලබා ගෙන නොතිබුණි.

**04. පද්ධති හා පාලනය**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.
(ආ) ආදායම්පරිපාලනය.
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය.
(ඈ) වාහන පාලනය.